- **ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණය කරයි.**

පුරාණයේ 'ශාන්තිකර්ම' මූලික කර ගෙන නර්තනය කරන ලද උඩරට, පහතරට සහ සබරගමු සාම්ප්‍රදායික නර්තනයන් අද වන විට නිර්මාණාත්මක ව මාත්‍රා යොදමින්, විවිධ රංග රටා, තල, දිසා සහ අවකාශය නිසි ලෙස භාවිත කරමින් මෙන් ම නොයෙක් ආකාරයට සංගීතය ද උපයෝගී කර ප්‍රාසංගික ව ඉදිරිපත් කරයි. එසේ ම නොයෙක් ගීත සඳහා ද සාම්ප්‍රදායික නර්තනවල එන පද කොටස් මෙන් ම නිදහස් චලන ද යොදා ගනිමින් නර්තනය නිර්මාණය කර ඉදිරිපත් කිරීම අද සුලබ ව දැකිය හැකි ය.

මෙවන් නිර්මාණාත්මක රංගනයන් වෙනුවෙන් ඔබ තුළ ඇති දක්ෂතා එළි දැක්වීම සඳහා බන්දුල ජයවර්ධන සූරීන් විසින් නිර්මාණය කරන ලද 'බෙර හඬ' නාට්‍යයේ එන ''හණික වරෙව් කොල්ලනේ'' ගීතය යොදාගත හැකි ය. එම ගීතයට උචිත චලන නිර්මාණයේ දී විවිධ කරුණු සැලකිල්ලට ගත යුතු වෙයි.

**ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණය කිරීම සඳහා සැලකිය යුතු කරුණු :**

- බන්දුල ජයවර්ධන සූරීන් විසින් නිර්මාණය කරන ලද ''බෙර හඬ'' නාට්‍යයේ ''හණික වරෙව් කොල්ලනේ'' ගීතය කිප වරක් ශ්‍රවණය කිරීම.
- එම ගීතයේ වචනාර්ථය සාකච්ඡාවට බඳුන් කිරීම.
- එම ගීතයේ ඇති ගායන ශෛලිය පිළිබඳ අවබෝධ කර ගැනීම.
- ඒ අනුව කිප වරක් ගායනා කිරීම.
- එහි තාලය, රිද්මය, ප්‍රකාශනය පිළිබඳ අවබෝධය ලබා ගැනීම.
- ශිෂ්‍යයන් කණ්ඩායම් කිපයකට වෙන් වීම.
- මුලින් දැක්වූ කරුණු අවබෝධ කොට ගනිමින් සුදුසු චලන තෝරා ගැනීම.
- අන්‍යයන්ට ඇහුම් කන් දෙමින්, අදහස් ගරු කරමින් සහයෝගයෙන් එම චලන යොදමින් නර්තන අංගය නිර්මාණය කිරීම.
- තල, දිසා, අවකාශ භාවිතය උපයෝගී කර ගනිමින් දුටු දේත්, උගත් දේත් භාවිත කරමින් නර්තන අංගය නිර්මාණය කිරීම.
  රංග රටා, යොදමින් නිදහස් චලන සහ සාම්ප්‍රදායික නර්තනයෙන් නිර්මාණය කර ගත් අලංකාර මාත්‍රා (පද) යොදමින් ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණය කිරීම.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)